**2018 අගෝස්තු මස මාසික සභා රැස්වීම**
**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

2018 අගෝස්තු මස මාසික සභා රැස්වීම 2018.08.08 වන දින පෙ 10.00.ව.ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්, පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.07.05 වන දින පැවති මාසික සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### I. සාමදාන විනිශ්චකාර තනතුර පිළිබඳ මහජන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් පළාත් පාලන ආයතනයන්ට තේරී පත් වූ මහජන නියෝජිතයින්ට තනතුරට සමගාමීව හිමිවන සාමදාන විනිශ්චයකාර තනතුරේ කාර්යභාරය හා අදාල වගකීම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018.09.01 දින පෙ.ව. 9.00 සිට දහවල් 12.00 දක්වා පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG2/3/4/2 හා 2018.07.21 දිනැති ලිපිය මගින් දන්වා ඇති බවත් එම අවස්ථාවට සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රී තුමියන්ලාට සහභාගි වන ලෙසත් ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

### II. 2017- භාන්ඩ සමීක්ෂණයෙන් ඉවත් වන පොත් ලැයිස්තුව

මහජන පුස්තකාලයේ 2017 භාණ්ඩ සමීක්ෂණයෙන් පුස්තකාල සාමාජිකයින් අතින් අස්ථානගතවී මුදල් ගෙවා ඇති පරිග්‍රහණ ලේඛණයෙන් ඉවත් වන පොත් ලැයිස්තුව ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### III. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

පැළැන්දකන්ද ජල ව්‍යාපෘතියේ Pl 57 දරණ යූ. අමරදාස යන නමින් ඇති ජල බිල්පත ඔහුගේ පුතා වන යූ. සමන් කුමාර අමරදාස යන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### IV. නඩු කටයුතු සඳහා ඉදිරිපත්කරන වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු නාමලේඛනය

2018.06.08 දිනට හිඟව පවතින වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු වෙනුවෙන් නඩු පැවරීමට නියමිත නම් ලැයිස්තුව ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. <u>පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම</u>

පසුගිය සභා රැස්විමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී.

## 4. <u>සභාව නමින් ලැබී ඇති ලිපි ,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 4.1. ර/ශ්‍රී වළගම්බා විද්‍යාලයේ නාම පුවරු සම්බන්ධවයි.

වැලිගෙපොල ශ්‍රී වළගම්බා මහා විද්‍යාලයට ප්‍රවේශ වන මංසන්ධියේ ඇති විද්‍යාලයේ නම සඳහන් නාම පුවරු දෙක ගොඩනැගිල්ලකට අවහිර වීම හේතුවෙන් ඉවත්කර ගැනීමට සිදුව ඇති බැවින් එම නාම පුවරු ප්‍රාදේශීය සභාවේ මාර්ග සීමාවන්ට යටත් වන්නේ දැයි සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රී වළගම්බා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද 2018.06.07 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

### 4.2. අනවසර වෙළඳසැල ඉවත්කර ගැනීම සම්බන්ධවයි.

වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගල්පාය වසමේ තාලිගමයාය ගම්මානයේ උස්ඇල්ල ගමට හැරෙන මංසන්ධියේ පාර අවහිර වන ලෙස ඊ.ඒ.ප්‍රදීප් චින්තක මහතා විසින් අනවසර වෙළඳසැලක් පවත්වාගෙන යන බවත්,ඒ සම්බන්ධව සොයා බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත්,දන්වමින් තාලිගමයාය ප්‍රදේශවාසීන් එක්ව 2018.07.04 හා 2018.07.31 දිනැතිව එවන ලද ලිපි ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදී.

### 4.3. දිවි නැගුම ජංගම අලෙවි සැළ සම්බන්ධවයි.

දිවි නැගුම මඟින් ස්වයං රැකියාලාභින්ට ලබා දුන් ජංගම අලෙවි කුටියක් එන්.ඩී.කේ.පද්මිණී මහත්මියට ලැබි ඇති බවත්,එය පවත්වා ගෙන යාමට හඳගිරිය ධර්මදීපාරාම විහාරාස්ථානයට යන මාර්ගය අසළ ඉඩක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා මඟින් කරන ලද ඉල්ලිම එතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

### 4.4. මාර්ගයක් කොන්ක්‍රිට් කිරිම සම්බන්ධවයි.

වැලිගෙපොල -බලංගොඩ ප්‍රධාන මාර්ගයේ සිට අරාවතුගොඩට පිවිසෙන මාර්ගයේ ඉතාම දුෂ්කර කොටසක් වන පන්සලේ ළිඳ ආශ්‍රිතව ගල්පොත්ත සඳහා කොන්ක්‍රිට් දමා මාර්ගය සකසා ගැනිමට

ඒ.එම්.විජේරත්න මහතා ඇතුළු ප්‍රදේශවාසීන් එක්ව කරනු ලබන ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභා ගත කරන ලදී.

## 4.5. බෝක්කු කඳන් සඳහා ප්‍රතිපාදන ලබාගැනීම

හටංගල ග්‍රාම නිලධාරී වසමේ ගල්පොත්තාවල ගම්මානයේ ලන්දෙළිදයාය ගමට යාමට තනා ඇති ගුරු පාරෙහි බෝක්කු 03 ක් ඇති අතර ඒ සඳහා අවශ්‍ය අඩි 06 බෝක්කු කඳන් 06 ක් ලබාදෙන ලෙස ඉල්ලා ඉන්ද්‍රාණි යටිකිඳ මහත්මිය ඇතුළු ප්‍රදේශවාසීන් එක්ව කරනු ලබන ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4.6. නිවසක් ඉදිකිරීමට අවශ්‍ය දැව ලබා ගැනීම.

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝපිටිගොඩ ග්‍රාම නිලධාරී වසමේ කැලැගම්මන පදිංචි බී.වී.ඉන්ද්‍රරත්න මහතා විසින් තම නිවසට අවශ්‍ය දැව ලබා ගැනීම සඳහා සුසාන භූමියෙහි වැටී ඇති ලුණුමිදෙල්ල ගස ලබා ගැනීමට අවසර ඉල්ලාකර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4.7. මාර්ගයක් කොන්ක්‍රීට් කර සකස් කරදෙන ලෙස ඉල්ලා සිටීම.

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිගෙපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මිදෙල්ලන ගොඩ මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීමට රු.50,000/= ක ප්‍රතිපාදන ලබා දෙන ලෙස ගම්වාසීන් විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා මඟින් කර ඇති ඉල්ලීම එතුමා විසින් සභාවට ඉදිරිපත්කරන ලදී.

## 4.8. වැලිගෙපොල - හේන්යාය මාර්ගයේ අවදානම් කොටස් සකස් කර ගැනීම සම්බන්ධවයි.

ඉහත මාර්ගය සම්බන්ධ ගැටළුව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් අංක ACLG 06/02/05-23 හා 2018.07.12 දිනැති ලිපියෙන් කරනු ලබන ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 5. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 6. <u>කල් දී ඇති යෝජනා</u>

### 6.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල ඉදි කිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ දායකත්වය ලබා ගැනීම.

සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල ඇස්තමේන්තු ගත රු 24,900,000.00 ක් වූ මුදලින් 80% ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණයක් හැටියටත්,ඉතිරි 20% ක මුදල සඳහා සභා දායකත්වය ලබා දීමටත්, සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම ප්‍රාදේශීය සභාවට අනුබද්ධිතව පවත්වා ගෙන යනු ලබන හුණුවල මහජන පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් (E Library) බවට පත් කිරිම සඳහා අවශ්‍ය පරිගණක ඇතුළු අනෙකුත් තාක්ෂණික උපකරණ සහ මග පෙන්වීම් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් ලබා දීමට කැමැත්ත පළ කර ඇති බවත්,එම ආයතනය පෙන්වා දෙන ආකාරයට පුස්තකාල ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් පුළුල් කරගත යුතු බවත් ,සඳහන් කළ ගරු සභාපතිතුමා ,දැනට පවතින පුස්තකාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමට යන වියදමට සාපේක්ෂව බලන විට කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකිරීම වඩාත් ඵලදායී බවට කරුණු අනාවරණය කළේය.දැනට පුස්තකාලය පවතින ගොඩනැගිල්ල ඉතා පැරණි ඉවත් කළ යුතු තත්වයේ පවතින එකක් මෙන්ම ඉදිවෙමින් පවතින කාර්යාල ගොඩනැගිලි සැලැස්මේ පුස්තකාලය සඳහාද කොටසක් වෙන් කර ඇති බවත් සඳහන් කළේය.

තව දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මෑතකදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඇගයීමකට අනුව හුණුවල පුස්තකාලය සබරගමුව පළාතේ ප්‍රථමස්ථානය හිමිකර ගැනීමද අගය කරමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය මෙම වරප්‍රසාදය හිමිකර දී ඇති බවත්,රත්නපුර දිස්ත්‍රික්කයට ලැබෙන එකම අවස්ථාවද මෙය වන බවත්ය.එබැවින් ,කාර්යාල ගොඩනැගිල්ල පළමු මහල ඉදි කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමට වෙනත් මූල්‍ය ප්‍රභවයක් නොමැති බැවින්,අදාල සේවා සම්පාදන කාර්යයන් වඩාත් ඵලදායි ලෙසත්,කාර්යක්ෂම ලෙසත්,ඉටු කිරීමට හා තිරසාර සංවර්ධන අරමුණු වෙත ළඟා වීමට මෙය අවස්ථාවක් කර දෙන ලෙස ඉල්ලා සිටීමෙන් පසුව ඉහත යෝජනාවට සභාවේ එකඟතාවය ඵල විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා මෙම අවස්ථාවේදී සභාව අමතමින් ,දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් දැනට ලබාගෙන ඇති ණය ශේෂ පියවීමට හා මෙම ව්‍යාපෘතිය මඟින් ලබා ගන්නා ණය සහ පොළිය ගෙවීමට සහා අරමුදල් තර කර ගැනීමේ ක්‍රමෝපායන් සකස් කර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.

ඒ අනුව දැනටමත් සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අමතරව ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාව, ත්‍රී රෝද රථ නවතා තැබීම හා වාහන වල බර සහ වේඟ සීමා දැක්වෙන අතුරු ව්‍යවස්ථා පළාත් සභාවේ සම්මත කර ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කර ඇති බවත්,ඉදිරියේදී සභා බල ප්‍රදේශයට ගැලපෙන ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු කර ඒවා බල පැවැත්වෙන අයුරින් කටයුතු කිරීමට ක්‍රියාකරන බවත්,පැවසීමෙන් අනතුරුව,ඉහත යෝජනාවට සභාවේ ඒකමතික එකඟතාව හිමිවිය.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා පෙ.ව.11.30ට සභාවට පැමිණෙන ලදී.

II. දැනට පුරප්පාඩු වී පවතින පහත තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම,

මෙම සභාවේ පවතින මුරකරු,රියදුරු සහ වැඩ ක්ෂේත්‍ර කම්කරු 03ක් සඳහා සේවා ගිවිසුම් මත පහත නම් සඳහන් අය බඳවා ගැනීමටත්,

<u>මුරකරු</u>

- ආර්.ඒ.මිලාන් මාලක රණසිංහ මයා,උතුරු හුණුවල,ඕපනායක.

<u>වැඩ ක්ෂේත්‍ර කම්කරු</u>

- ඒ.බී.විනෝත් ප්‍රසංග හේමන්ත මයා,මාදොල,ඕපනායක.
- ආර්.එම්.අශාන් දිනිදු අබේවික්‍රම මයා,කඩේවත්ත, ඕපනායක.
- කේ.ඒ.ගයාෂාන් ලක්ෂිත ආනන්ද මයා,දුනුකාරගොඩ,ඕපනායක.

<u>රියදුරු</u>

- එච්.ඩබ්.සුපුන් චින්තක මයා,උඩවෙල,ඕපනායක.

සෞඛ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවය අනුව අනියම් /ආදේශක සෞඛ්‍ය කම්කරුවන් 02ක් සහ එක් රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

*2018.08.08 දින මාසික සභා රැස්වීම*

රියදුරු

- වයි.ජයසිංහ මයා, නැකත්වලකඩ, උඩරංවල.

සෞඛ්‍ය කම්කරු

- ඩී.කේ.සමන් අමරසිංහ මයා, හේන්යාය, ඕපනායක.
- පී.වසන්ත ප්‍රියලාල් මයා, කට්ටංගේ, කහවත්ත.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 50ක් තුල සේවා සම්පාදනයේදී සිටින සේවකයින් ප්‍රමාණවත් නොවීම නිසා විවිධ දුෂ්කරතාවන්ට ලක්වන අවස්ථා ඇති බවට මෙම අවස්ථාවේදී කරුණු පැහැදිලි කල ගරු සභාපතිතුමා ,බල ප්‍රදේශයේ කසළ ඉවත් කිරීමේ කටයුතු සහ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරුවන් ප්‍රමාණවත් නොවීම මෙන්ම,සිටින සේවකයින් නිවාඩු යාමේදී විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන අතර,බල ප්‍රදේශය තුල ඇති සියලුම ප්‍රාදේශීය සභා මාර්ග දෙපස සහ සුසානභූමි සියල්ල අධික ලෙස වල්බිහිවී ඇති බවත්,කුළී පදනම මත ඒවා එළිපෙහෙලි කිරීමට සිදුව ඇති බවටත්,ගරු සභාපතිතුමා විසින් කරුණු පැහැදිලි කරමින් ජල යෝජනා ක්‍රමවල නඩත්තු කටයුතු සඳහා සේවකයින් අලුතින් බඳවා ගැනීමේ අවශ්‍යතාවය දැඩි ලෙස බලපා ඇති බව පෙන්වා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් නවක සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවට සභාවේ ඒකමතික එකඟතාව ලබා දෙන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනාද සභාවට ඉදිරිපත් කරන ලදී.

III. ප්‍රධාන මාර්ගය දෙපස බැනර් කටවුට් ප්‍රදර්ශනය නවතා දැමීම, ඒ වෙනුවට දැන්වීම් ප්‍රදර්ශණය සඳහා බළන්ගොඩ - රත්නපුර මාර්ගයේ ස්ථාන 10 ක් හා බලංගොඩ - පල්ලෙබැද්ද මාර්ගයේ ස්ථාන 05 ක් ඇති කිරීම සුදුසු බවත්,

IV. උඩවෙල ඩිංගිරිහාමිගොඩ මාර්ගයේ සිරිල් මහතාගේ නිවස අසල සිට අජිත් මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,

V. සඳගනාගම නිසසල පෙර පාසලට විදුලිය ලබා ගැනීම සහ විදුලි බිල සභාව මගින් ගෙවීම අවශ්‍ය බවත්,

VI. ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ උපාධි අපේක්ෂිකාවක වන ඩී.එම්.සී.ඩී.බී. තානායම්වත්ත මෙනෙවියට මාස 06 ක කාල සීමාවකට යටත්ව දිනකට රු. 500.00 ක දීමනාවක් සහිතව ආයතනික පුහුණුවක් සඳහා අවස්ථාව ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී.

VII. තවද 2018.06.07 සභා රැස්වීමේ අංක 6.1 (XVIII) දේශීය ණය සම්බන්ධ යෝජනාවේ රු. 554,407.52 ක ණය මුදල හා පොලී මුදලට හිඟ මුදල වන රු 78,023.03 ක මුදල සෑම කාර්තුවකම ගෙවිය යුතු බැවින් නව වාරික මුදල රු. 632,430.55 ක් ගෙවීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

VIII. හත්තැලිහෙල හල්දොල මාර්ගයේ මැනුම් කටයුතු කිරීමට ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුගේ අංක OPDS/LND/02/R'cass/HATH/15/05 හා 2018.07.31 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී.

IX. ගල්පාය වසමේ තාලිගම මාර්ගයේ උස්ඇල්ල මංසන්ධියේ ඊ.ඒ. ප්‍රදීප් චින්තක මහතා විසින් අනවසරයෙන් ඉදිකර ඇති වෙළඳසැල ඉවත් කිරීම

X. වැලිගෙපොල මාළු ලැල්ල සහ ඕපනායක සතිපොළ මාළු ලැල්ල ගිවිසුම් අවලංගු කිරිම සම්බන්ධයෙන් සභා තිරණයක් ගැනිම සුදුසු බවත් යෝජනා කරන ලදි.

XI. ඕපනායක සති පොළ ඉදිරිපිට ඇති කඩ කාමර 08 හි මාසික කුළිය තක්සේරු වාර්තාව අනුව සංශෝධනය කිරිම සුදුස බව යෝජනා කරන ලදි.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අචිනි එස් අබේවික්‍රම මැතිනිමිය විසින් ස්ථිර කරන ලදි. වැඩි දුරටත් කරුණු සාකච්ජා කරමින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද IX යෝජනාව සම්බන්ධයෙන් මාර්ගය අවහිර නොවන සේ ජංගම වෙළඳ සැලක් පවත්වා ගැනීම සුදුසු බවට තීරණය විය.වැලිගෙපොල මාළු ලැල්ල බදු ගෙන ඇති ජේ.ජේ.රුක්මන් මහතා (අංක 39/ලංකාබරණ වත්ත,දෙහිගස්තලාව) විසින් බදු මුදල් ගෙවිම පැහැර හැර ඇති බැවින් ගිවිසුම් ප්‍රකාර ව බදු ගිවිසුම අවලංගු කිරිමටත්,2019 වර්සය සඳහා නැවත ටෙන්ඩර් කරන තුරු ඊ ලඟ වැඩිම ටෙන්ඩරය ඉදිරිපත් කර තිබු කේ.එම්.රත්නසිලි මියට රු.32,000.00 කට එම ටෙන්ඩරය නැවත ලබා දිමටත්,ඉහත රැස්විමේදි සකාච්ජා කර තිරණය කරනු ලැබීය.එමෙන්ම ඕපනායක

මාළු ලැල්ල ඉදිරියට කරගෙන යාමට නොහැකි බවත්,බදු ගිවිසුම අවලංගු කර දෙන මෙන් කේ.කේ.ජයවර්ධන මහතා විසින් ඉල්ලීමක් කර ඇති බැවින්, ඒ සඳහා දෙවන ටෙන්ඩර්කරුවෙකුද නොමැති බැවින් ඕපනායක මාළු ලැල්ල 2019 වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කරන තුරු ආදායම් පරිපාලක මහතා මඟින් බදු මුදල් එකතු කිරීමට සාකච්ජා කර තිරණය කරන ලදි.අනතුරුව ගරු සභාපතිතුමාගේ සියළු යෝජනා සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණ.

**6.2.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී

I. හත්තැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මාර්ගය දෙපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට JCB යන්ත්‍රය ලබාදෙන ලෙසත්,

II. හත්තැල්ල මාර්ගයේ ප්‍රතිසංස්කරණය කළයුතු ස්ථාන සැකසීම සුදුසු බවත්, යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්. ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් පල කරමින් විධායක ඉංජිනේරු කාර්යාලය මගින් හත්තැල්ල මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන බවත්, එමගින් සිදු නොවන කාර්යයන් සභාව මගින් සිදු කිරීමට පියවර ගන්නා බවත් පැවසීමෙන් අනතුරුව ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**6.3.** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්. ධම්මිකා මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පල්ලෙබැද්ද ප්‍රධාන මාර්ගයේ වැලිගෙපොල පිටකන්ද 12 කණුව අසල වීථි ලාම්පු සවි කිරීම අවශ්‍ය බවත්,

II. හල්ගහවිට කන්දගම නැණසලට වීථි ලාම්පුවක් සවි කිරීම අවශ්‍ය බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

**6.4.** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්. රත්නපාල මැතිතුමා

I. බෙලිමාලියද්ද, කෙවලගල මාර්ගය සකසා දීම අවශ්‍ය බවත්

II. හඳගිරිගොඩ නිවාස 100 ප්‍රජා ශාලාව අසල සිට ඉහලට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්

III. ගංගොඩගම වසමේ පෙත්තරකුඹුර ආර , කැකුණ ආර එක්වන මෝදර හරහා පාලමක් ඉදි කිරීම අවශ්‍ය බවත්

IV. හඳගිරිය වසමේ වැව පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 6.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

I. බටදූර ග්‍රාම නිලධාරී වසම සඳහා ජංගම පුස්තකාලයක් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්

II. හත්තැලිහෙල හල්දොල මාර්ගය සඳහා හියුම් පයිප්ප 02 ක් ලබාදීම අවශ්‍ය බවත්

III. පාඩියාවත්ත සුසාන භූමිය තුල අනවසරයෙන් වගා කටයුතු සිදු කරන හෙයින් එය මැනුම් කර පාඩියාවත්ත මරණාධාර සමිතියට ලබා දියයුතු බවත්, යෝජනා කරන ලදුව එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

## 6.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමා

I. ඇහැල කුඹුර නාවලුව හරහා මැදගම දක්වා මාර්ගයේ නාවලුව අසල දොළට බෝක්කුවක් ඉදි කිරීම සහ පස් කපා පිරවීම සුදුසු බවත්,

II. බන්දුකන්ද කෝවිල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ.ඩබ්ලිව්. සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

## 6.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ. ඩබ්ලිව්. සුමනාවතී මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

I. එම්.ඒ. ශාන්ත මහතාගේ නිවස අසළ තැන්න ඇළේ පැති බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත්,

II. වගලහේන මාර්ගය සංවර්ධනය අවශ්‍ය බවත්

III. ටී. සිරිපාල මයාගේ නිවස ඉදිරිපිට සිට පැළැන්දකන්ද ප්‍රධාන මාර්ගයේ බෝක්කුව පුපුරා ඇති බැවින් ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත්,

IV. යී.පියසේන මහතාගේ නිවස අසල මාර්ගයට බෝක්කුවක් දැමීම සුදුසු බවත්

V. හෙට්ටගෙවත්ත මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,

VI. උඩුකුඹුර මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම සුදුසු බවත්,

VII. වැලිකැටිය මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,

VIII. අඹගහවින්න පැළැන්දකන්ද මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම අවශ්‍ය බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමිය විසින් සභාගත කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 6.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බඹරගල ලීකෙලි ගල්ලයාය ගම්මානයේ අභ්‍යන්තර පාරවල් සැකසීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලද අතරම එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එන්.වී. ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිව සභා සම්මත විය.

## 6.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එන්.වී. ශ්‍රීමාවතී මැතිතුමිය

I. හටංගල වසමේ ගල්පොත්තාවල ලිදේයාය මාර්ගයේ ස්ථාන 03 ක් සඳහා බෝක්කු කඳන් 06 ක් ලබාගැනීම අවශ්‍ය බවත්

II. බෝපිටිගොඩ වසමේ පොදු සුසානභූමිය තුල ඇති දිරාගිය ලුණුමිදැල්ල ගස කපා ඉවත් කර ගැනීම අවශ්‍ය බවත්.

III. බෝපිටිගොඩ වසමේ හීන්න ප්‍රදේශයේ යෝජිත නිවාස ව්‍යාපෘතියක් සඳහා ගෙපල් කැපීමට JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බවත්,

IV. කොට්ටිඹුල්වල පන්සල අවට වීථි පහන් සවිකර ගැනීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමිය විසින් සභාගත කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 6.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

I. පහල රංවල බහුකාර්ය ගොඩනැගිල්ලට පැමිණෙන මහජනතාවගේ ජල අවශ්‍යතාවය වෙනුවෙන් ජලය ලබා ගැනීම හා ගබඩා කර තැබීමට අඟල් ½ ජල නල 20 ක් හා ලීටර් 500 ක ටැංකියක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

II. අම්මඩුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග පිළිසකර කර ගැනීමට සභාවේ JCB යන්ත්‍රය ලබාදෙන ලෙසත්,

III. තැන්නහේන ග්‍රාම නිලධාරී වසමේ තැන්නහේන ගමේ කෙළවර පිහිටා ඇති නිවෙස් හා ඉඩම් වලට පිවිසීමට ඇති මාර්ගය සභාවේ JCB යන්ත්‍රය යොදා සංවර්ධනය කරදෙන ලෙසත්,

IV. හඳගිරිය,ගල්පාය වැනි තෝරාගත් ප්‍රදේශවල සත්ව ගොවිපලක් සහ අලෙවි ස්ථාන ඇති කිරීමට පියවර ගන්නා ලෙසත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ඒ. දමිත් විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත IV වන යෝජනාව සම්බන්ධයෙන් වැඩ දුරටත් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා ගල්පාය, හඳගිරිය වැනි තෝරාගත් ප්‍රදේශවල සත්ව ගොවිපොළවල් ස්ථාපිත කිරීමත්, නාගරික ප්‍රදේශවල අලෙවි මධ්‍යස්ථාන ඇති කිරිමත් තුළින් ප්‍රාදේශිය සභාවේ ආදායම් තත්වය ඉහල නංවා ගත හැකි බැවින් ණය අරමුදලක් හෝ ලබාගෙන එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව සඳහන් කළේය. අනතුරුව මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත්කළ සියලු යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 6.11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ඒ. දමිත් විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. බටදූර දෙල්වළකන්ද මාර්ගයට බොරළු පස් යෙදීමට JCB යන්ත්‍රය හා ට්‍රැක්ටරය ලබාගැනීම අවශ්‍ය බවත්,

II. බෝධිමළුව විහාරස්ථානයේ මාර්ගය සෑදීමට හා බොරළු පස් යෙදීමට JCB යන්ත්‍රය හා ට්‍රැක්ටරය ලබාගැනීම අවශ්‍ය බවත්,

III. රංවල මහතැන්න මාර්ගය සෑදීමට බොරළු පස් යෙදීමට JCB යන්ත්‍රය හා ට්‍රැක්ටරය ලබා ගැනීම අවශ්‍ය බවත්, යෝජනා කිරීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

## 7. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 7.1. 2018.06.24 වන දින පැවති මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 130 - 95 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 8. ආදායම් වියදම් වාර්තා

### 8.1. 2018.ජූනි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 649,357.61 | වැටුප් හා දීමනා | 2,428,424.22 |
| කුලී | 59,400.12 | ගමන් වියදම් | 13,787.50 |
| බලපත්‍ර ගාස්තු | 89,250.00 | සැපයුම් හා උපකරණ | 229,165.00 |
| සේවා සඳහා ගාස්තු | 132,052.75 | ප්‍රාග්ධන වත්කම් අළු.හා නඩත්තුව | 221,070.00 |
| වරෙන්තු ගාස්තු | 997,955.69 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 208,346.17 |
| වෙනත් ආදායම් | 399,554.49 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 391,347.80 |
| වෙනත් ආධාර | 2,502,645.17 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 50,000.00 |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 4,830,215.83 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 16,110.23 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,558,250.92 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | 412,621.37 | ප්‍රාග්ධන වැය | 578,781.09 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 5,242,837.20 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 101,187.78 | සේවක ණය | - |
| තැන්පත් | 107,624.52 | තැන්පත් | 4,750.00 |
| අත්තිකාරම් | 28,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | - |
| වෙනත් ලැබීම් එකතුව | 236,812.30 | ජල ගබඩා | - |
| - | - | ගබඩා(ඖෂධ) | 100,000.00 |
| | | සමුච්චිත අරමුදල | 859,079.35 |
| | | වෙනත් ගෙවීම් | |
| - | - | වෙනත් ගෙවීම් එකතුව | 963,829.35 |
| මුළු එකතුව | 5,479,649.50 | මුළු ගෙවීම් | 5,100,861.36 |

## 8.2. 2018 ජූනි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.06.30 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **213717** | **5%** | **618316** | **32%** | **1321684** | 4489564 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි නිරීම1.43 | | 125000 | | | **117175** | **94%** | **7825** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **252600** | **99%** | **2400** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **783000** | **107%** | **(53000)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **4500** | **15%** | **25500** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **82652** | **18%** | **375348** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1295298 | **69%** | **1916165** | **32%** | **4158835** | 573643 |
| 9 | විකුණුම් | | 497000 | | | **84838** | | | |
| 10 | යන්ත්‍ර කුලියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **94350** | **9%** | **955650** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **37333** | **15%** | **212667** | |
| 13 | පොදු වෙළඳපල කුලී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **51800** | **12%** | **376200** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **35746** | **32%** | **74254** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 5000 | **19%** | **119390** | **47%** | **134610** | 20,880.00 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **408000** | **102%** | **(8000)** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **67600** | **23%** | **232400** | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොළී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවක ණය පොලී1.64 | | **40000** | | | **23016** | **58%** | **16984** | |
| **25** | අයකර ගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **3150** | **13%** | **21850** | |
| **26** | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.06.30 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයෙන් |
| **27** | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අය කර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **489000** | **49%** | **511000** | |
| **29** | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළ භූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **304996** | **35%** | **573144** | |
| | මුළු එකතුව | **6837036** | **15179140** | **1646261** | **24%** | **5501169** | **36%** | **9265809** | **5216655** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.06.30 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | - | 0% | 150 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 26,000 | 24% | 81000 | - |
| 7 | නොපවරා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 31000 | 16% | 169000 | |
| 8 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 2300 | 15% | 12700 | |
| 9 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 3359 | 17% | 16,641 | |
| 10 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 11 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 204937 | 46% | 243453 | - |
| 12 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 37400 | 43% | 50,200.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 304996 | 35% | 573144 | - |

## 9. <u>වෙනත් කරුණු</u>

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

I. විශේෂයෙන් කෘෂි ආර්ථික රටාවක හුරු වූ ජන කොටසක් වෙසෙන මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රංවල , වැලිගෙපොල ප්‍රදේශ වල සමූහ වශයෙන් රිලවුන් ගැවසීම නිසා වගා හානි බහුල වශයෙන් සිදු වන බව ට කරනු අනාවරණය කළ ගරු මන්ත්‍රීතුමා,එම ප්‍රදේශ වල කෙසෙල්,පොල් වැනි බෝග වගාවන් සම්පූර්ණයෙන්ම විනාශයට පත් ව ඇති බව ප්‍රකාශ කළේය.අනතුරුව මෙම තත්ත්වය නිසා එම ප්‍රදේශවාසීන්ගේ ජන ජීවිතයට විශාල තර්ජනයක් එල්ලවී ඇති බැවින්,රිලවුන් පලවා හැරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් වනජීවී දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙස එතුමා ඉල්ලා සිටියේය.

II. ර/මහඹීමාර විද්‍යාලය ළගම පාසල හොඳම පාසල ව්‍යාපෘතියට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ දැඩි පැසසුමට ලක් වුවත් එම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද වැසිකිළි පද්ධතිය ඉදි කිරීමේ කටයුතු නතර වී ඇති බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා, එම ව්‍යාපෘතියේ වැඩ නතර වීම නිසා ගුරු -සිසු දෙපිරිසම අපහසුතාවයට ලක් ව ඇති බවත්, මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ සහ කළාප අධ්‍යාපන අධක්ෂතුමාගේ අවධානයට යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

මෙම අවස්ථාවේදී සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමා මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ උඩරංවල ප්‍රදේශයට සභාව මඟින් කිසිදු ප්‍රතිලාභයක් මෙතෙක් ලබා දී නොමැති බව ප්‍රකාශ කරමින් ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ප්‍රතිපාදන වෙන් කරවා දෙන ලෙසත්,හත්තැල්ල මාර්ගය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

### 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

කෘෂිකර්ම අමාත්‍යාංශයේ යෝජනාවකට අනුව වැව් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතව ඇති බැවින් එම කටයුතු වලදී සිදු වන ප්‍රමාදයන් වැලැක්වීම සඳහා සහන ලබා දෙන මෙන් ඉල්ලා සිටි අතර, ගොවීන් දැනුවත් කිරීමට අවශ්‍ය බවද පෙන්වා දුන්නේය.

### 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් වසන්ත මැතිතුමා

හල්ලින්න මාර්ගයේ පොදු ප්‍රවාහන ගැටළු පවතින බවත්, මේ හේතුව නිසා පාසල් වල දරුවන් අසීරුතාවයට පත්ව ඇති බවත්,මල්මීකන්ද මාර්ගයේ වැඩි වශයෙන් වාහන ධාවනය වන නිසා

මාර්ගය අබලන් වී ඇති බවත්,මහජන පුස්තකාලයේ සතිඅන්ත පුවත්පත් වල අඩුවක් පවතින බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

මෙම පළාත් පාලන බල ප්‍රදේශයට ඕපනායක හා වැලිගෙපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකම ඇතුලත් වන බැවින් ,ඒ දෙක සඳහා වෙන වෙනම පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙකම සඳහා සියළුම සභිකයින්ට සහභාගී වීමට අවස්ථාව ලබා දිය යුතු බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා දැනට වැලිගෙපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඕපනායක කොට්ඨාශ වල සභිකයින් කැඳවා නොමැති බැවින් ,ඉදිරියේදී පැවැත්වෙන සම්බන්ධීකරණ කමිටුවට කැඳවීම් කරන ලෙස දන්වා යැවිය යුතු බව සඳහන් කළේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ර/රංවල විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානයට ලක් නොවීම හේතුවෙන් එම විද්‍යාලය වැසී යන තත්වයට පත්ව ඇති බවට පහත සඳහන් කරුණු අනාවරණය කළේය.

- "අ.පො.ස.(උ.පෙළ) දක්වා අධ්‍යාපන කටයුතු සිදු කල ර/රංවල විද්‍යාලයේ සිසුන් මේ වන විට ක්‍රමක් ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.එම විද්‍යාලයේ විද්‍යාගාර ගොඩනැගිල්ලද දිරාපත් වෙමින් පවතින බැවින්,පාසල් ළමුන් බොහෝ පිරිසක් වෙනත් පාසල් කරා යොමු වෙමින් පවතින අතර, මෙම විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් බලධාරීන්ගේ නිසි අවධානය යොමු නොවුණහොත් එම විද්‍යාලය වැසී යා හැකිය"

මෙම කරුණ සම්බන්ධයෙන් බලධාරීන්ගේඅවධානය යොමුකරවන ලෙස ගරු මන්ත්‍රීතුමා මෙහිදී ඉල්ලා සිටියේය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

පොල්වත්ත හේන මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා 2012 වර්ෂයේ රුපියල් කෝටි 22 ක මුදලක් ලැබී ඇති බවත්,මාර්ගයේ සංවර්ධන කටයුතු මේවන විට අතරමග නතරවී ඇති අතර සංවර්ධනය කල කොටස් ද නැවත කැඩී ඇති බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා,මාර්ග සංවර්ධනයට ලැබුණු මුදලට කුමක් වූයේද යන්න බලධාරීන් කිසිවෙක් කිසිදු සඳහනක් නොකරන බැවින්,මේ සම්බන්ධව

කරුණු විමසා ගරු ජනාධිපතිතුමාට හා විෂය භාර අමාත්‍යවරයාට ලිපියක් යොමුකරන ලෙස ඉල්ලා සිටියේය.

## 10. සභා රැස්වීමේ නිමාව.

ගරු මන්ත්‍රීතුමන්ලා විසින් දැක්වූ අදහස් හා යෝජනා සම්බන්ධයෙන් කෙටි සමාලෝචනයක් කල ගරු සභාපතිතුමා I Road ව්‍යාපෘතියේ වැඩ තැන් තැන් වල නතරවී ඇති බවත්,රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී ද ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කළත් එම ඉදිකිරීම් කටයුතු විධිමත්ව සිදු නොවන බව සඳහන් කළේය.එමෙන්ම ඉත්තගලයාය ප්‍රදේශයේ ජීවත්වන පවුල් 30 ක ජනතාවට ඔවුන් පදිංචිව සිටින ඉඩම් කොටස් ලබා දෙන ලෙස ඉල්ලා සිටියත්,වන ජීවී අධක්ෂක ඉඩ නොදීම හේතුවෙන් ඔවුන් අසරණ වී ඇති බවත්,සඳහන් කළේය.අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 1.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.